**77** වන ජනරජ දිනය නිමිත්තෙන්

**2026** ජනවාරි **26** වන දින සන්ධ්‍යාවේ පැවති ප්‍රිය සම්භාෂණයේ**දී**

මහ ක**ොමසාරිස්තුමා** විසින් සිදු කළ කතාව

ගරු පූජ්‍ය පක්ෂයෙන් ද,

අපගේ ප්‍රධාන ආරාධිත අමුත්තා වන ගරු සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමාගෙන් ද,

ශ්‍රී ලංකාවේ ගරු හිටපු ජනාධිපතිවරුන්ගෙන් ද,

ශ්‍රී ලංකා රජයේ ගරු අමාත්‍යවරුන්ගෙන් ද,

ගරු ආණ්ඩුකාරවරුන්ගෙන් ද,

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ද අධිකරණ ක්ෂේත්‍රයේ නිලධාරීන්ගෙන් ද,

රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගෙන් ද,

ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්ගෙන් ද

ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නායකයන්ගෙන් ද,

මාධ්‍යවේදීන්ගෙන් ද

ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ඇතුළු ඉන්දීය ප්‍රජාවේ සාමාජිකයන්ගෙන් ද

සම්භාවනීය අමුත්තන්ගෙන් ද

පැමිණ සිටින සියලු මහත්ම මහත්මීන්ගෙන් ද අවසරයි.

සුභ සන්ධ්‍යාවක්, නමස්කාර්, ආයුබෝවන්, වණක්කම්!

අපගේ 77 වැනි ජනරජ දින සැමරුම සඳහා ප්‍රථමයෙන්ම ඔබ සැම ඉන්දියා හවුස් වෙත සාදරයෙන් පිළිගන්නවා.

අද දින අප හා එක් වූ ඔබ සැමට මාගේ හෘදයාංගම කෘතවේදිත්වය පිරිනමනවා. ඔබගේ පැමිණීම සහ සහයෝගය අපට ශක්තියක්. එය වඩා ගැඹුරු හවුල්කාරිත්වයක් ගොඩනැගීම සඳහා කටයුතු කිරීමට අන් කිසිවකටත් වඩා අපව දිරිමත් කරනවා. බිලියන 1.4ක් වන ඉන්දියානුවන් වෙනුවෙන් මා ඔබගේ මිත්‍රත්වයට සහ හවුල්කාරිත්වයට ස්තූතිය පළ කරනවා.

වසර 76කට පෙර අද වැනි දිනක ඉන්දීය ජනතාව අපගේ ව්‍යවස්ථාව බලාත්මක කළා. එතැන් සිට අප ලොව විශාලතම ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍යය සහ ලොව වේගයෙන්ම වර්ධනය වන ප්‍රධාන ආර්ථිකය බවට පත් වී තිබෙනවා.

මිත්‍රවරුනි,

මෙම වසරේ ජනරජ දිනයේ තේමාවන් දෙක වන්නේ වන්දේ මාතරම් සහ आत्मनिर्भर භාරත් යන්නයි. වන්දේ භාරත් තේමාව විසින් स्वतंत्रता හි අදහස හෝ නිදහසේ අදහස සමරන අතර आत्मनिर्भर භාරත් යන්න समृद्धि හෙවත් සෞභාග්‍යය සඳහා අපගේ අභිලාෂය මෙහෙයවනවා.

වන්දේ මාතරම් යනු ඉන්දියාවේ ජාතිය හා බද්ධ වූ ගීතයයි. අප මෙම ගීතයේ 150 වන සංවත්සරය සමරනවා. ඉන්දියාවේ නිදහස් සටනේ වීරයන්ට පණ පෙවූ ගීතය වූයේ එයයි. එය ඉන්දීය මාතාව පිළිබඳ අපගේ අභිමානයේ ප්‍රකාශනයක් වන අතර අද පවා අප දිරිමත් කරන ගීතයක් වෙනවා.

आत्मनिर्भर භාරත් යන්න තුළින් වැඩි වශයෙන්ම ස්වයං රඳාපැවැත්මක් සහිත ඉන්දියාවක් ගොඩනැගීම උදෙසා අපගේ අනාගත ප්‍රයත්නයන් පිළිබිඹු වෙනවා. එයින් හුදකලා වීමක් අදහස් වන්නේ නැහැ. එය වේගවත් නමුත් ඔරොත්තු දෙන වර්ධනයක් සඳහා වන අභිලාෂයක්. එයින් අදහස් වන්නේ ගෝලීය වශයෙන් වඩා විශ්වාසදායි සහකරුවෙකු වීම සඳහා දේශීය හැකියාවන් ගොඩනගා ගැනීමයි. මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අප බදු ක්ෂේත්‍රයේ සිට ශ්‍රම වෙළෙඳපොළ දක්වා ද, අභ්‍යවකාශ ක්ෂේත්‍රයේ සිට ආරක්ෂක ක්ෂේත්‍රය සහ න්‍යෂ්ටික බලශක්ති ක්ෂේත්‍රය දක්වා ද, යටිතල පහසුකම්වල සිට නිෂ්පාදනය දක්වා ද සෘජු විදේශ ආයෝජනවල සිට නිදහස් වෙළෙඳ ගිවිසුම් දක්වා ද ප්‍රතිසංස්කරණ ගණනාවක් සිදු කර

තිබෙනවා. අනුකූලතා අවශ්‍යතාවයන් අඩු කිරීම සඳහා ගන්නා අඛණ්ඩ ප්‍රයත්නයන්ගේ සිට ඉන්දියාවේ ව්‍යාපාර කිරීමේ පහසුව වැඩි දියුණු කිරීම වැනි විවිධ මූලපිරීම් ද ප්‍රතිසංස්කරණයන්ට ඇතුළත් වෙනවා. ආර්ථික විද්‍යාඥයන් පවසන්නේ ඉන්දියාව මේ වන විට ස්ථායි වර්ධනයක්, පහළ යන විරැකියා අනුපාතයක් සහ අඩු වන උද්ධමනක් සමඟින් ඇතැම් විට හොඳම අවස්ථාවේ පසු වන බවයි. ඒ අනුව ඉන්දියාව 2025 වසරේදී ලොව සිව්වන විශාලතම ආර්ථිකය බවට පත් වීම පුදුමයක් නොවෙයි. අප මෙම දශකය අවසන් වීමට පෙරාතුව ලොව තෙවන විශාලතම ආර්ථිකය බවට පත් වීමේ මාර්ගයට අවතීර්ණ වී තිබෙනවා.

ඉන්දියාවේ නැගීම ගෝලීය වශයෙන් විශ්වාසදායි සහකරුවෙකු වීම සඳහා වඩා තීව්‍ර වූ වගකීම පිළිබඳ හැඟීම සමඟ එක් වී තිබෙනවා. වික්සිත් භාරත් හෙවත් සංවර්ධිත ඉන්දියාවක් සඳහා අපගේ අරමුණ විශ්ව මිත්‍ර හෙවත් ලොවටම මිතුරකු වීම සඳහා අපගේ දැක්ම සමඟ මනා ලෙස සමපාත වෙනවා. අපගේ අසල්වාසිත්වය තුළ මෙම ප්‍රවේශය මහාසාගර් (MAHASAGAR) සහ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තීන් තුළින් පිළිබිඹු වෙනවා.

මිත්‍රවරුනි,

ශ්‍රී ලංකාවට මෙම විදේශ ප්‍රතිපත්ති දැක්ම තුළ විශේෂ ස්ථානයක් හිමි වෙනවා. අපගේ නොබිඳිය හැකි බැඳීම අපගේ ශිෂ්ටාචාරමය සබඳතා සහ භූගෝලීය ආසන්නතාවය තුළින් ශක්තිමත් වී තිබෙනවා. අද වන විට අපගේ නායකයන් අතර පමණක් නොව අප දෙරට ජනතාව අතර පවා අසමසම විශ්වාසයක්, හොඳහිතක් සහ මිත්‍රත්වයක් පවතිනවා. ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා අසල්වාසී රාජ්‍යයන් අතර සහයෝගී හවුල්කාරිත්වය සඳහා ගෝලීය ආකෘතියක් ලෙස මතු වී තිබෙනවා.

අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය සහ එයට පෙර ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ 2024 දෙසැම්බර් ඉන්දීය සංචාරය විසින් මෙම හවුල්කාරිත්වය සඳහා ඉහළ අභිලාෂ සහිත මාර්ග සිතියමක් නිර්මාණය කර තිබෙනවා. භෞතික, ඩිජිටල් සහ බලශක්ති සම්බන්ධකතාවය අපගේ හවුල්කාරිත්වයේ ප්‍රධාන කුලුනු ලෙස එකඟ වී තිබෙනවා.

සංවර්ධනය සඳහා දරෙට විසින් බෙදා හදා ගන්නා අභිලාෂයන් සහ ආරක්ෂාව සඳහා පොදු කැපවීම ප්‍රධාන අරමුණු ලසෙ මතු වී තිබනෙවා.

පසුගිය වසර තුළ අප මමෙ පොදු අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා මහත් පරිශ්‍රමයකින් කටයුතු කර තිබනෙවා. සාම්පූර් සූර්ය විදුලි ව්‍යාපෘතියේ ඉදිකිරීම් දැනටමත් ඇරඹී තිබනෙවා. විදුලිබල ජාල අන්තර් සම්බන්ධතාවය සම්බන්ධයනේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගනෙ තිබනෙවා. ත්‍රිකුණාමලය බලශක්ති කේන්ද්‍රස්ථානයක් ලසෙ සංවර්ධනය කිරීම සම්බන්ධයනේ ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර සාකච්ඡා සිදු වමේන් පවතිනවා.

ඉන්දියාව භෞතික යටිතල පහසුකම් නවීකරණය සඳහා ද සහය ලබා දනෙවා. මහව - ඕමන්තේ දුම්රිය මාර්ගයේ නවීන සංඥා පද්ධතිය සමඟ නවීකරණය කරන ලද දුම්රිය මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක වමේන් පවතිනවා. පසුගිය දශකයක පමණ කාලයේදී ඉන්දියාව කිලෝ මීටර 500ක පමණ දුම්රිය මාර්ග නැවත ඉදිකිරීමට සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහ කිලෝ මීටර් 400ක් පමණ සඳහා සංඥා පද්ධතීන් ස්ථාපනය කිරීමට සහය ලබා දී තිබනෙවා. කන්කසන්තුරය වරාය නවීකරණ ව්‍යාපෘතිය නුදුරේදීම ඇරඹීමට අපේක්ෂිතයි. නාගපට්ටිනම් සහ කන්කසන්තුරය අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවාව දැන් නිරන්තරයනේ ක්‍රියාත්මක සේවාවක් බවට පත් වී තිබනෙවා. අප දැන් රාමේශ්වරම් සහ තලයි මන්නාරම අතර බෝට්ටු සේවා ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු කරමින් සිටිනවා. ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳව සැලකීමේදී, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සතියකට ගුවන් ගමන් වාර 180ක් පමණ ක්‍රියාත්මකයි. පසුගිය වසරේදී, ට්‍රිච් නගරය චතේනායි වලින් අනතුරුව යාපනය සමඟ ගුවනින් සම්බන්ධ වූ දවෙනි ගමනාන්තය බවට පත් වුණා.

ඩිජිටල්කරණය අපගේ හවුල්කාරිත්වයේ ප්‍රධාන අවධානයක් යොමු වන ක්ෂේත්‍රයක්. ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත් ව්‍යාපෘතිය (SLUDI) ක්‍රියාත්මක කිරීමහේ ප්‍රගතිය සමඟ ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණ ගමන වේගවත් වීමට නියමිතයි. මයෙ ශ්‍රී ලංකාවේ ඩිජිටල් පොදු යටිතල පහසුකම් හි සමස්ත පද්ධතියම පූර්ණ වශයනේ ක්‍රියාත්මක කිරීමට අවකාශ සලසනු ඇති. ශ්‍රී ලංකාව තුළ UPI ගවේීම්

පද්ධතිය හඳුන්වාදීම මුදල් රහිත පද්ධතියක් ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකාවේ අරමුණ ළඟා කර ගැනීමට සහයෝගය ලබා දෙනවා.

අප අපගේ හවුල්කාරිත්වය අනාගතයට සූදානම් කිරීම සඳහා ද කටයුතු කරමින් සිටිනවා. පසුගිය වසරේදී අප කෘත්‍රිම බුද්ධිය ඇතුළු තාක්ෂණයේ නව ක්ෂේත්‍ර වෙත පිවිසුණා. අපගේ ප්‍රාරම්භක සමාගම් සහ ව්‍යාපාර ප්‍රාග්ධන සමාගම් ශ්‍රී ලංකාව තුළ නවීන නවෝත්පාදන පාරිසරික පද්ධතියක් ගොඩනැගීම සඳහා සහයෝගය ලබා දෙනවා.

අපගේ පුළුල් ආර්ථික සහයෝගීතාවය ද තවදුරටත් වර්ධනය වෙමින් පවතිනවා. 2025 වසරේදී, ඉන්දියාව ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයන් පිරිසක් පැමිණෙන රට ලෙස තවදුරටත් පෙරමුණේ පසු වුණා. පසුගිය වසරේදී ඉන්දියාව ශ්‍රී ලංකාවේ දෙවෙන විශාලතම අපනයන ගමනාන්තය බවට පත් වුණා. අප තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම වෙළෙඳ සහකරු ද වුණා. ඉන්දීය ආයෝජන ඉහළ යන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර 2025 වසරේදී ශ්‍රී ලංකාවට පැමිණි සමස්ත ආයෝජනයන්ගෙන් 50%කට පමණ දායකත්වය ලබා දුන්නා.

අභිලාෂ සහිත සමාජයන් වශයෙන් සියලු දෙනා ඇතුළත් වන සහ සෞභාග්‍යමත් අනාගතයක් ළඟා කරගැනීමෙහිලා අපගේ සාර්ථකත්වයට සංවර්ධන සහයෝගීතාවය ඉතා වැදගත් කරුණක්. ඇමරිකානු ඩොලර් මිලියන 850කට අධික ප්‍රදානයන් සමඟින් අප විසින් ශ්‍රී ලංකාවට ලබා දී ඇති සංවර්ධන ආධාරවල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 7.5කට අධිකයි. අපගේ සංවර්ධන සහයෝගිතාවය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ටම විහිදෙනවා. අවශ්‍යම අයට ප්‍රතිලාභ සලසමින් අප අපගේ ජනතා කේන්ද්‍රීය ව්‍යාපෘතීන් ක්‍රියාවට නංවනවා. පසුගිය වසරේදී අප විවිධ ක්ෂේත්‍ර රැසක ශ්‍රී ලාංකිකයන් සඳහා අපගේ පුහුණු සහ ධාරිතා ගොඩනැගීමේ ප්‍රයත්නයන් පුළුල් කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සිට පළාත් සභා නියෝජිතයන් දක්වා ද, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දක්වා ද, විගණන සහ අධිකරණ නිලධාරීන් දක්වා ද මාධ්‍ය වෘත්තිකයන්ගේ සිට විවිධ කර්මාන්ත ශිල්පීන් සහ කිරි ගොවීන් දක්වා ද සෑම අංශයකම විශේෂඥයන් මෙම වැඩසටහනේ ප්‍රතිලාභ ලබනවා.

මිත්‍රවරුනි,

ඉන්දියාව ශ්‍රී ලංකාවේ වඩාත්ම විශ්වාසදායි සහ රඳාපැවතිය හැකි සහකරුවා වන බව මා නිතරම පවසා තිබෙනවා. ඉන්දියාව දිට්වා සුළි කුණාටුව හමුවේ නැවත වරක් ශ්‍රී ලංකාවේ පළමු ප්‍රතිචාරකයා වුණා. අප සුළි කුණාටුව ශ්‍රී ලංකාවට පැමිණි පළමු දිනයේදී ම සාගර් බන්ධු මෙහෙයුම දියත් කළා. අපගේ නාවික හමුදාවේ INS වික්‍රාන්ත් සහ INS උදේගිරි නෞකාවන් කොළඹට පැමිණ තිබූ අතර එම නෞකාවන් විසින් වහාම ආධාර ලබා දුන්නා, එසේම, මුදා ගැනීමේ මෙහෙයුම් සඳහා සහය ලබා දුන්නා.

අනතුරුව අප ටොන් 1100ක අත්‍යවශ්‍ය සහනාධාර ලබා දුන්නා. අප ටොන් 14.5ක ඖෂධ සහ වෛද්‍ය උපකරණ ද ලබා දුන්නා. ටොන් 60ක පමණ උපකරණ ද භාර දුන්නා. මාර්ග සම්බන්ධතා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අප ටොන් 228ක බේලි පාලම් ඒකක ගුවනින් රැගෙන ආවා. ඉන්දීය ගුවන් හමුදාවේ Mi-17 හෙලිකොප්ටර් යානා සහ ජාතික ආපද ප්‍රතිචාර බලකායේ කණ්ඩායමක් මුදා ගැනීමේ සහ සහන ප්‍රයත්නයන් සඳහා සහය ලබා දුන්නා. ඉන්දීය යුධ හමුදාව මහනුවර අසල ක්ෂේත්‍ර රෝහලක් ස්ථාපනය කරමින් පුද්ගලයන් 8000කට පමණ ප්‍රතිකාර කළා. BHISHM හදිසි වෛද්‍ය ප්‍රතිකාර ඒකක දෙකක් ද ගුවනින් ශ්‍රී ලංකාවට රැගෙන ආ අතර සුළි කුණාටුවෙන් වැඩිම බලපෑමකට ලක් වූ ප්‍රදේශවල ඒවා ස්ථාපනය කෙරුණා. සමස්තයක් වශයෙන් අප කඩිනමින්, නිසගයෙන් සහ පුළුල් ලෙස ප්‍රතිචාර දැක්වූවා. කොන්දේසි විරහිත එම සහයෝගය යහපත් අසල්වාසීභාවයක් සහ වගකීම පිළිබඳ හැඟීමක් විසින් මෙහෙයවනු ලැබුවා.

දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා අග්‍රාමාත්‍යතුමාගේ විශේෂ නියෝජිතයකු ලෙස අපගේ එකමුතුභාවය ප්‍රකාශ කිරීම සහ ශ්‍රී ලංකාව වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 450කට අධික ආධාර පැකේජයක් නිවේදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියා. මෙම පැකේජයේ අරමුණ වන්නේ දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව ක්‍රියාත්මක Rebuilding Sri Lanka වැඩසටහන සඳහා සහය ලබා දීමයි. මෙම පැකේජයට පුළුල් අංශ පහක් ඇතුළත් වෙනවා:

(i) මාර්ග, දුම්රිය මාර්ග සහ පාලම් සම්බන්ධතා පුනරුත්ථාපනය සහ ප්‍රතිෂ්ඨාපනය;

(ii) නිවාස සහ ජල සැපයුම් නැවත ගොඩනැගීම;

(iii) සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා සහය;

(iv) කෘෂිකර්මාන්තය සහ පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා සහය; සහ

(v) වඩා හොඳ ආපදා ප්‍රතිචාර සහ සූදානම සඳහා කටයුතු කිරීම.

මමෙ පැකේජයේ සැබෑ ප්‍රයෝජනය එය ක්‍රියාත්මක කිරීම සහ එහි බලපෑම මත පදනම් වන බව අප දන්නවා. මමෙ පැකේජය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අප ශ්‍රී ලංකා රජය සමඟ සමීපව කටයුතු කරනවා. මමෙ පැකේජය යටතේ ව්‍යාපෘතීන් දැනටමත් ඇරඹී ඇති බව මා සතුටින් සඳහන් කිරීමට කැමතියි. විශේෂයෙන්ම, පාලම් සහ දුම්රිය මාර්ග ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සහ නිවාස සහ රෝහල් වනෙත් ස්ථානවල පිහිටුවීම යන හදිසි කර්තව්‍යයන් දැනටමත් ඇරඹී තිබනෙවා. අනාගත ස්වභාවික ආපදාවන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවේ සූදානම ඉහළ නැංවීම සඳහා ද සාකච්ඡා පැවැත්වී තිබනෙවා.

මිත්‍රවරුනි,

විශේෂයෙන්ම අප දරෙට භූගෝලීය වශයනේ ඉතා ආසන්නව පිහිටා තිබනෙ නිසා අපගේ ආරක්ෂක සහයෝගීතාවයේ වැදගත්කම මනෙකෙයි කියා කිව නොහැකියි. අපගේ අසල්වාසි ප්‍රදේශයේ අන්තර් දේශසීමා අපරාධ ජාල සහ නීතිවිරෝධී කටයුතු මැඩපැවැත්වීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමේදී මයෙ හොඳින් පනේ යනවා. සමුද්‍රීය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අපගේ ඒකාබද්ධ ප්‍රයත්නයන් තුළින් ද එය පනෙනෙවා. අපට මිනිසා විසින් නිර්මාණය කරන ලද හෝ ස්වභාවික ආපදාවන්ට මුහුණ දීමට සිදු වූ අවස්ථාවන්හිදී එය වඩා හොඳින් දැනුණා. වඩාත්ම මෑත උදාහරණයක් ලසෙ දිට්වා සුළි කුණාටුව දැක්විය හැකියි. වෛද්‍යකාවන් සැපයීම, අපදා අවම කිරීම සහ සහන සහ පුනරුත්ථාපන කටයුතු සම්බන්ධයනේ ශ්‍රී ලංකාවේ හැකියාවන් ගොඩනැගීම අරමුණු කරගත් මූලපිරීම් ඇතුළු පුහුණු වැඩසටහන් සහ ඒකාබද්ධ අභ්‍යාස හරහා ශ්‍රී ලංකාවේ ආරක්ෂක ක්ෂේත්‍රයේ හැකියාවන් ඉහළ නැංවීම සම්බන්ධයනේ ද එය ප්‍රයෝජනවත් වී තිබනෙවා.

මාගේ කතාව අවසන් කිරීමට පෙර මා තවත් කරුණක් සඳහන් කිරීමට කැමතියි. එනම්, මාගේ අදහස අනුව, අපගේ සබඳතාහි වඩාත් විශේෂම පැතිකඩ වන්නේ ස්වභාවයෙන්ම අප දෙරට ජනතාව අතර පවතින බැඳීමයි. ක්‍රිකට්, ආහාර කලාව, යෝගා හා ආයුර්වේද, නර්තනය සහ සංගීතය යන කවරක් සම්බන්ධයෙන් වුව ද අප අතර පවතින්නේ එකම හැඟීමක්. එය අපගේ ඉතිහාසයන්, භාෂාවන්, සංස්කෘතීන් සහ විශ්වාසයන් වැනිම පොදු දෙයක්. රාමායණය හා සබැඳි ස්ථාන වේවා, බෞද්ධ පුදබිම් වේවා, එය පවසන්නේ වර්තමානයේදීත් දිනෙන් දින ගැඹුරු වන අපගේ පෞරාණික බැඳීම පිළිබඳ කතාවයි. ලබන මස මුල දී දේවනිමෝරි සර්වඥ ධාතූන් වහන්සේලා ගංගාරාම විහාරයේ ප්‍රදර්ශනය කෙරෙන අතර එය සියවස් ගණනාවක් පුරා විවිධ හුවමාරු සහ අන්තර්ක්‍රියා තුළින් ගොඩනැගී ඇති අපගේ සම්බන්ධතාවයේ සුවිශේෂී ස්වභාවය යළිත් අවධාරණය කරනු ඇති. මෙනිසා අපගේ සබඳතා අන් කිසිදු සබඳතාවයකට වඩා වෙනස්. අපගේ ඉතිහාසයේ මෙම ගලායාම සමඟ කටයුතු කිරීමට සහ පොදු සෞභාග්‍යයේ සහ යහපැවැත්මේ අනාගතයක් ගොඩනැගීමට එකඟ වෙමු. මෙම ඒකාබද්ධ ප්‍රයත්නය සඳහා මා ඔබගේ සහය සහ සහයෝගය අපේක්ෂා කරනවා.

ජයි හින්ද්. ඉන්දියා-ශ්‍රී ලංකා මිත්‍රත්වය දිනේවා!

තැන්ක් යූ, බොහොත් බොහෝත් ධන්‍යවාද්. බොහෝම ස්තූතියි. නණ්රි.

***